# සුභාෂිතයෙන්

ඇතත් නැතත් පරලොව සුදනනි මහත
හලොත් යෙහෙකි පව් කම් නොතබාම සිත
නැතත් එ පරලොව ඉන් වන අවැඩ නැත
ඇතොත් නැතැයි පව් කල හට වෙයි විපත

අන්වය : මහත සුනනනි, පරලොව ඇතත් නැතත් පව්කම් සිත නොතබාම හලොත් යෙහෙකි. එ පරලොව නැතත් ඉන් වන අවැඩ නැත. ඇතොත් නැතැයි පව් කල හට විපත වෙයි.

තේරුම : මහත සුදනනි - මහත් වූ (ගරුතර) සුදනනි, පර ලොව ඇතත් නැතත් - පරලොවක් තිබුනත් නැතත්, පව්කම් - පව්කාර (කම්) සිතිවිලි, සිත නොතබාම - සිතේ රඳවා නොගෙන, හලොත් යෙහෙකි - දුරලීම හොඳ ය. එ පරලොව නැතත් - (අප විසින් ඇතැයි සිතා සිටින) ඒ පරලොව නැති උනත්, ඉන් වන අවැඩ ගැන - (එසේ) පව්කම් දුරලීමෙන් වන අනර්තයක් නැත. ඇතොත් - (යම් විදියකින්) පරලොවක් තිබුනොත්, නැතැයි පව් කල හට පරලොවක් නැතැයි සිතා පව් කල කෙනාට, විපත වෙයි විනාශය සිදු වෙයි.

බන දහම් පොත්වල දෙලොවක් ගැන කියවේ. වරෙක එය ''එලෝ මෙලෝ දෙක'' ලෙසත්, තවත් වරෙක ''මෙලෝ පරලෝ දෙක'' ලෙසත් ය එහි සඳහන් වන්නේ. තුන්ලොව ගැන කියන විට ''එලෝ - මෙලෝ - පරලෝ'' ගැන සඳහන් නොවේ. ''දිව්‍ය - බ්‍රහ්ම - මනුශ්‍ය'' යනුවෙන් හා ''දිවය - මනුශය, ප්‍රේත'' යනුවෙන් ය එය හඳුන්වා ඇත්තේ. ගිය ආත්මය - මේ ආත්මය - ලබන /එන ආත්මය යනුවෙනි එය සාමාන්‍ය වැවහරේ ඇත්තේ.

එලොවත් පරලොවත් එකක්ම යයි සමහරු කියති. එහෙත් 'එලොව ගිහිං මෙලොව ආවා'' යන්නේ එලොව යනු ගිය ආත්මය බව පෙනේ.

අද මෙන් ම එදාත් පරලෝක සංකල්පය ගැන සැක පහල කලවුන් සිටි බව කියති. එබඳු අදහස් දැරුවෝ බොහෝ විට නිහැඬිව සිටියහ. මෙලොවක් පරලොවක් නැති එකකු ලෙස හඳුන්වනු ලැබීමට ඔවින් අකමැති වූ නිසාය ඒ.

කුඩා දුපතක තනි වූවකුට කිසිදු පවක් කල නොහැකි යයි සිතමි. ඔහුට පවක් කල හැක්කේත් ඔහු පවක් කල එකකු ලෙස හංවඩු ගැසෙන්නේත් එහි තවත් එකකු සිටිය හොත් ය. එළුවකු හෝ හාවකු සිටියහොත් ඌ මරාගෙන කෑ හැකිය. ගොරිල්ලකු හෝ ගවදෙනක සිටියොත් ඔහු සමහර විටක ලිංගික ඇසුරකට පෙළඹෙනු ඇත. ඒ සිදුවීම් දෙක පව්කම් ලෙස සැලකිය හැකිදැයි නොදනිමි. එය පව් කම් ලෙස සිතන්නන්ද සිටිය හැකිය. මම ඒ ගැන වාද නොකරමි. රහසින් පව් කරන අය දහසක් දෙනා අතර, එසේ නොකරන එකක් වුවද සිටිය හැකිය. මගේ තැනැති අදහස නම් පවක් සිදුවිය හැක්කේ එයින් අනෙකකුට රිදුමක් හෝ විපතක් වුවහොතිනි. අනෙකාගේ විරෝදය මැද්දේ ඔහුට රිදෙන යමක් කිරීම පවකි. මෙය අදහසක් පමනි.

විකසිත




31 වන පිටෙන්

එවැනි රන් රිදී ආකර පිළිබඳ කියවෙන සෙල්ලිපි හෝ ප්‍රබල පූරාවිද්‍යා සාධක මෙතෙක් හමුවී ද නැත. මේ රන් රිදී හමුවූ බවට කථා සඳහන් වන්නේ මහ වංශය ඇතුළු වංශ කථාවල පමණි. මේ අතර විල්හෙල්ම් ගයිගර්ට අනුව මෙරට තිබූ රන් ආකර රජු යටතට ගෙන අධික ලෙස එම ඉල්ලම් ගෙන නොසැලකිලිමත් පරිහරණය නිසා ඒවා අවසන් වන්නට ඇත. මෙරට ගං පතුල්වල තිබී කුඩා රන් කැබලි (පිරිසිදු නොකරන ලද) ලැබී ඇතැයි ද ඔහු පවසයි.

මේ අතර රත්නපුර කලවාන ප්‍රදේශයේ ග්‍රාමනාම සම්භවය විමසා බැලීමේදී රන් හෝ ඊට සමාන භූගත ද්‍රව්‍යයක් හමුවී ඇති බවට සාක්ෂි ලැබේ. කලවාන නම සකස් වන්නේ කළු වානේ හමුවූ තැන කළුවාන කලවාන වීමෙනි. රක්වාන රනු රතු වානේ හමුවූ පළාතය. කලවාන - රක්වාන ආසන්නයේ එකට පිහිටි ප්‍රදේශයන්ය.

කලවාන - මානාන නගරයේ සිට මද දුරකින් හගරංගල නම් ගම් ප්‍රදේශයක් වේ. වානේ ආකර මෙම ප්‍රදේශයේද තිබුණු අතර මෙහිදී රංවන් පාට වානේ හමුවී ඇත. ඒ නිසා මේ ප්‍රදේශය නොදරංගල වී පසුව හගරංගල වී ඇත. කලවාන ආසනයට අයත් දුම්බර මානාන යනු මිනිරන් පතල් බහුල ප්‍රදේශයකි. මෙම පතල් අද වසා දමා ඇත. මෙම පතල් ඉල්ලම් කලවාන ප්‍රදේශය දක්වා පැතිර ඇතැයි විශ්වාස කෙරේ. මේ අනුව වානේ සමඟ මිනිරන් සමඟ රසායනික විපර්යාසයන්ට ලක් වූ රන් වැනි රන්වන් පාටැති ඛණිජ වර්ගයක් මෙරට තිබුණා විය හැක. සමහර විට එය යපස් මිශ්‍ර රන් කැට ද වූවා විය හැක. මන්ද සබරගමුව ඛණිජ සම්පත් බහුල ප්‍රදේශයක් බැවිනි.

සූරිය
SOORIYA
ශ්‍රී ලාංකික ඔබේ වෙළඳසල
22 Lorne Street Lalor Vic 3075
Tel 03 9402 5380 Melway 9B6

THE KINGDOM OF RAIGAM®
21 වන සියවසේ දේශීය සමාගම
www.raigam.lk
Sri Lanka
Raigam
රයිගම් නම් කවදත් කොතැනත්
හරිම රසයි!
දැන් අළුත් රස රැසක්!
Try New Fried & Devel Cuttle
Fish Soy TVP and
New String Hopper Flour
(now you don't have to use boiling or hot water to make string hopper mix/dough! ඇල් වතුරෙන් අනන්න!)
Raigam – Premium Quality Food
Manufacturers from Sri Lanka.
Raigam – A trusted brand for taste and uncompromised quality.
*Raigam Soy, Noodle Meal Kits, Vinegar, String Hopper Rice Flour, Dehydrated Vegetables, Coffee, Spices & Raigam Biscuits.*
Sole Agents in Australia & New Zealand:
E-Techno Enterprises, Essendon, Victoria
Tel:03-9370 3813 Fax orders: 03-9337 9468
Email:sales@etechno.com.au July 2006

අරක්කැමියකු අවශ්‍යයි.
මෙල්බන්හි අලුතින් ආරම්භ කරන්නට බලාපොරොත්තු වන ආපනශාලාවකට පලපුරුදු ආපනශාලා අරක්කැමියකු අවශ්‍යයි.
විමසන්න
0422 051 075
(සවස 6න් පසු)

තිසර FM 97.4

මෙල්බන්හි රෝයල් චිල්ඩ්රන් රෝහලට ආධාර පිණිස විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක වන බැවින් ජූනි 23 වන සෙනසුරාදා තිසර ගුවන් විදුලිය ගුවන්ගත නොවන අතර ජූනි 30 වන දා සිට සුපුරුදු පරිදි දහවල් 12 සිට 2 දක්වා තිසර ගුවන්විදුලියට සවන් දීමට ඔබට හැකි වන බව තිසර දන්වා එවා ඇත.






අන්දරේ සේවය කළා යයි ඉතිහාසයේ සැළකෙන්නේ රාජාධිරාජසිංහ රජුගේ (ක්‍රි ව 1780 - -1798) කාලයේ දී ය. රජතුමා ද කවියෙකි. එසේම එතුමාගේ අවධියේ කවිකාර මඩුවක් ද පවත්වාගෙන ගිය බව ඉතිහාසයේ සඳහන් වෙයි. මෙම කවි මඩුවේදී කැකිරිගම කවියා නම් ප්‍රකට කවියා ද අන්දරේද තරගයට කවි කියූ බව ජනප්‍රවාද වල සඳහන් වෙයි.

රාජාධිසිංහ රජතුමා ගමනක් යන විටෙක තමා දන්නා ලොකුම බොරුව කවියෙන් කියන ලෙස අන්දරේට අන කළ හ. එවිට අන්දරේ මේ කිව් කීවේ ය.

ඔටුනු පැළඳ සිටියත් සිහසුණේ මත
ඔබ ගොන් රජෙකි මේ මහ ගොන් රැළට මැද
අදමිටු කුහක පාහර කම් නිමක් නැත
ඔබ වැනි අමනයකු සිරිලක සිටියෙ නැත

මේ කවිය ඇසූ රාජතුමාට දැඩිව කෝප ගත්තේ ය. ''තා තොපගේ රජුට අපහාස කළා නොවි ද? තගේ හිස ගසා දමමි'' යි කඩුව අමෝරා අන්දරේ වෙත පැන්නේ ය.

එවිට අන්දරේ මේසේ කීවේ ය.

'පස්වාන් දහසකට බුදුවන්න දේවයන් වහන්ස. මා කීවේ මා දන්නා ලොකුම බොරුවයි.''

රජතුමා තමා වැටුණ අමාරුව ගැන කල්පනා කළේ ය. අන්දරේ ඇත්තක් කීවා යයි කියා දඬුවම් කළොත් අපහාසය සිදුවන්නේ තමාටම බව ඔහු තේරුම් ගත්තේ ය.

අන්දරේට එදින ද සමාව ලැබුණි.